සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
2300166
2877890

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்)
Additional Commissioner General (Revenue Policy & Admin)
2877891

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877892

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

තැ.පෙ. අංකය
த.பெ.இல.
P.O.Box No
1417

අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය. இல.353, கோட்டை வீதி, இராஜகிரிய. *No 353, Kotte Road, Rajagiriya.*

මගේ අංකය / எனது இல / My No. ED/07/03/06

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 25.06.2018

ලේකම්,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
<u>කොළඹ 01.</u>

මහත්මයාණෙනි,

<u>මාධ්‍ය නිවේදන අංක M27/2018 - ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව</u>

පහත දක්වා ඇති මාධ්‍ය නිවේදනය මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීම පිණිස කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමි.

කපිල කුමාරසිංහ
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්
මාධ්‍ය ප්‍රකාශක/ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

<u>පිටපත:</u>

අධ්‍යක්ෂ (මාධ්‍ය), මාධ්‍ය ඒකකය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - දැ.පි.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
2300166
2877890

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமானக் கொளகை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2877891

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகமைத்துவம்,
சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877892

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

තැ.පෙ. අංකය
த.பெ.இல.
P.O.Box No
1417

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**
**இலங்கை மதுவரித் திணைக்களம்**
**EXCISE DEPARTMENT OF SRI LANKA**

අංක 353, කෝට්ටේ පාර. රාජගිරිය. இல.353, கோட்டை வீதி, இராஜகிரிய. *No 353, Kotte Road, Rajagiriya.*

---

මගේ අංකය. / எனது இல: / My No. — ED/07/03/06

ඔබේ අංකය. / உமது இல: / Your No. —

දිනය / திகதி / Date — 25.06.2018

මාධ්‍ය නිවේදන අංක: **M 27/2018**

## <u>මාධ්‍ය නිවේදනය</u>

### <u>මත්ද්‍රව්‍ය භාවිතය හා නීති විරෝධී ප්‍රවාහණයට එරෙහි ජාත්‍යන්තර දිනය (2018.06.26) හා මත්ද්‍රව්‍ය විරෝධී සතිය (2018.06.26 – 2018.07.02)</u>

සෑම වර්ෂයකම ජූනි මස 26 වන දිනට යෙදෙන "මත්ද්‍රව්‍ය භාවිතය හා නීති විරෝධී ප්‍රවාහණයට එරෙහි ජාත්‍යන්තර දිනය" ට සමගාමීව 2018.06.26 දිනෙන් ආරම්භ වී 2018.07.02 දිනෙන් අවසන් වන සතිය "මත්ද්‍රව්‍ය විරෝධී සතිය" ක් ලෙස රජය විසින් නම් කර ඇති අතර, එම සතිය තුළදී දිවයිනේ සියළුම මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් විසින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් වල යෙදීමට සැළසුම් කර ඇත.

2. අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයෙහි මෙන්ම ජනාධිපති මත්ද්‍රව්‍ය කාර්ය සාධන බලකායෙහි ද සංවිධායකත්වයෙන් හා සියළුම මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහභාගිත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

3. මේ අනුව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් උක්ත "මත්ද්‍රව්‍ය විරෝධී සතිය" තුළදී සමස්ත දිවයිනම ආවරණය වන පරිද්දෙන් නීති විරෝධී මත්ද්‍රව්‍ය හා මද්‍යසාර නිෂ්පාදනය, ප්‍රවාහනය, සන්තකයේ තබාගැනීම ජාවාරම් කිරීම සහ අළෙවිය හා සම්බන්ධ මෙහෙයුම් සිදු කරන ලෙස සියළුම පලාත් භාර සහකාර සුරාබදු කොමසාරිස්වරුන් වෙත නියෝග කර ඇත.

4. සුරාබදු කොමසාරිස් ජනරාල් ආර්. සේමසිංහ මහතාගේ උපදෙස් පරිදි පැවැත්වෙන මෙම විශේෂ වැඩසටහන යටතේ මහජන පැමිණිලි හා තොරතුරු මත මත්ද්‍රව්‍ය හා සුරාබදු අපරාධ සිදුකෙරෙන ස්ථානයන් වැටලීමට හා එම සුරා අපරාධ ග්‍රහණය කිරීමට සිය අධීක්ෂණය යටතේ නිළධාරී කණ්ඩායම් යෙදවීමට සියලුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්හට නියෝග ලබා දී ඇත.

5. මෙම සමස්ත වැඩසටහන අධීක්ෂණය කිරීමේ වගකීම දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය වෙත පවරා ඇති අතර, එම වැඩ සටහනෙහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සුරාබදු මූලස්ථානයෙහි විශේෂ යාන්ත්‍රණයක් ද ස්ථාපිත කොට ඇත.

02 වන පිටුවට......

6. මෙම වැඩ සටහන සාර්ථක කරගැනීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මහජනතාවගේ සහයෝගය අපේක්ෂා කර සිටී. ඒ අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සිදුවන මත්ද්‍රව්‍ය හා සුරා අපරාධ සම්බන්ධයෙන් පහත දැක්වෙන අංක භාවිතා කරමින් තොරතුරු ලබාදෙන ලෙස මෙයින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

| | |
|---|---|
| දුරකථනය: | **0112 – 045 077** |
| ෆැක්ස්: | **0112 – 877 882** |
| විද්‍යුත් ලිපිනය: | **oiccrime@excise.gov.lk** |

7. මේ පිළිබඳ වැඩිදුර විස්තර පහත දුරකථන අංකයෙන් විමසා ලබාගත හැකිය.

| | |
|---|---|
| දුරකථනය: | **0113 – 888 032** |
| ජංගම: | **0772 – 602 842** |
| විද්‍යුත් ලිපිනය: | **dcehr@excise.gov.lk** |
| ෆැක්ස්: | **0112 - 877 895** |

කපිල කුමාරසිංහ
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්
මාධ්‍ය ප්‍රකාශක/ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
☎ 077-260-2842